1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(2) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.07. 02 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/EST/1/1/01 හා 2025.06.30 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.06.29 දාතමින් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 18/2020 (II) | 2025.05.26 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

අනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

"ජනතා හිතවාදී හා විලාදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/EST/1/1/01 | ඔබේ අංකය / உமது இல. / Your Number | | දිනය / திகதி / Date | 2025.06. 30 |
|---|---|---|---|---|---|

ලැබුණා 01 JUL 2025 පාලන අංශය

ලැබුණා 30 JUN 2025 ප්‍රධාන ලේකම් දකුණු පළාත ACSIA

1.55 Pm

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක CSS/03/13/CIR.COM.(2) හා 2025.06.06 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය අනුව දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, ඉදිරිපත් කර ඇති කමිටු නිර්දේශය පරිදි පහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා 2025.06.29 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වා එවමි.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය හා නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : **18/2020(II)** 2025.05.26 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද, ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

**කේ.පී.එස්. දමයන්ති**
පරිපාලන නිලධාරී,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2020 (II)

මගේ අංකය : EST/2/05/POL/0087
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2025.05.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ 2022.10.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 (I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නිලධරයන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් භාෂා පාඨමාලා හැදෑරීම මගින් හෝ අ.පො.ස (සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත් වීම සමඟ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් කාණ්ඩවලට අනුරූපී මට්ටම් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වීම මගින් හෝ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සංශෝධනය කිරීමට සහ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ගත යුතු සියලුම නිලධරයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 (I) මගින් 2024.10.16 දින දක්වා ලබා දී තිබූ සහන කාලය 2026.10.16 දින දක්වා දීර්ඝ කිරීමට 2025.04.21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

03. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.4 ඡේදයට පසුව 2.5 ලෙස නව ඡේදයක් ඇතුළත් කෙරේ.

"2.5 ඉහත පාඨමාලා වෙනුවට අ.පො.ස (සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත් වීම සමඟ ඉහත 2.1 ඡේදයේ සඳහන් කාණ්ඩවලට අනුරූපී මට්ටම් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වීම මගින් ද නිලධරයන්ට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවෙන් නිදහස් වීමට අවස්ථාව හිමි වේ."

04. නව සුදුසුකම පිළිබඳවත් සංශෝධිත සහන කාලය පිළිබඳවත් අදාළ නිලධරයන් දැනුම්වත් කරන මෙන් ද මෙයින් දන්වා සිටිමි.

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය ......චක්‍රලේඛ..........18/
2020 (II).......................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය .......ජූනි 26....... දින සිට
[illegible]

(අත්සන)
එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2693886
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-ii@pubad.gov.lk